ගැසට් නිවේදනය - සිංහල (Link): http://documents.gov.lk/files/gz/2024/7/2024-07-12(I-IIA)S.pdf

## අයදුම් කිරීම සඳහා උපදෙස්

1. අයදුම් කරන අවස්ථාව වන විට අයදුම්කරුවකු හට පෞද්ගලික විද්‍යුත් තැපැල් ලිපිනයක් **(Personal E-mail Address)** තිබිය යුතුය.

2. අන්තර්ජාල බැංකු පහසුකම් සහිත ණය **(Credit)** හෝ හර **(Debit)** කාඩ්පතක් මඟින් ගෙවීම් සිදු කළ යුතුය.

පියවර 01:-

පහත දක්වා ඇති ආකෘතිපත්‍රයට අනුව ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනය **(E-mail Address)**, සම්පූර්ණ නම, මුලකුරු සමඟ නම, ජාතික හැඳුනුම්පත් අංකය ***නිවැරදිව*** සම්පූර්ණ කළ යුතුය.

ඔබ ඇතුළත් කරනු ලබන මුරපදය **(password)** නැවතත් ඇතුළත් කිරීමට අවශ්‍ය වන බැවින් එය මතක තබා ගත යුතුය.

**Sign Up** මඟින් ලියාපදිංචි වීම ආරම්භ කරන්න.




පියවර 02:-

ඔබ ලබා දුන් විද්‍යුත් තැපැල් ලිපිනය **(E mail Address)** වෙත ලැබෙන පණිවුඩය තහවුරු කරන්න.

(විද්‍යුත් තැපැල් පණිවුඩය **(E mail)** නොලැබුණහොත් https://freg.germantec.lk/ වෙබ් පිටුව වෙත පිවිස **Reset Account** හරහා ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය සහ ඉහතින් සඳහන් කරන ලද මුරපදය ඇතුළත් කර ඔබගේ ගිණුම නැවත සකසා **(Reset)** ගන්න. ඉන්පසු නැවතත් **Sign Up** පිටුව වෙත පිවිසීමෙන් අදාල තොරතුරු අවධානයකින් යුතුව නිවැරදිව ඇතුළත් කර නැවත **Sign Up** මඟින් ලියාපදිංචි වන්න.)



පියවර 03:-

පහත දක්වා ඇති පරිදි ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනය **(E mail Address)** හා ඉහතින් සඳහන් කරන ලද මුරපදය **(Password)** අදාළ හිස්තැනෙහි යොදා අයදුම්පත්‍රය වෙත පිවිසෙන්න.




පියවර 04:-

පහතින් දක්වා ඇති ආකාරයට අයදුම්පත්‍රය සම්පූර්ණ කරන්න.







(ඔබගේ ජංගම දුරකථන අංකය හා වට්ස්ඇප් අංකය පහතින් දක්වා ඇති ආකෘතියට අනුව නියමිත අංක 10කින් යුතුව ඇතුලත් කරන්න.)




(ඔබ ඉල්ලුම් කරනු ලබන විභාග මාධ්‍යය හා මධ්‍යස්ථානය පසුව වෙනස් කළ නොහැකි බැවින් නිවැරදිව ඇතුලත් කරන්න.)



පියවර 05 :-

ඔබගේ අ.පො.ස.සාමාන්‍ය පෙළ ප්‍රතිඵලය හෝ ලන්ඩන් සාමාන්‍ය පෙළ ප්‍රතිඵලය නිවැරදිව ඇතුලත් කරන්න.




පියවර 06 :-

ඔබගේ කැමැත්තෙහි අනුපිළිවෙළට පහත පාඨමාලා තේරීම සිදු කරන්න.




පියවර 07 :-

අදාළ විභාග ගාස්තු ගෙවීම පහත ක්‍රමවේදයට සිදු කළ යුතුය.

අන්තර්ජාල බැංකු පහසුකම් සහිත ණය **(Credit)** හෝ හර **(Debit)** කාඩ්පතක් මඟින් ගෙවීම සිදු කළ යුතුය.






පහත දක්වා ඇති ආකෘතිපත්‍රය ආදර්ශයට ගෙන අන්තර්ජාල බැංකු පහසුකම් සහිත ණය (**Credit**) හෝ හර (**Debit**) කාඩ්පතක් මඟින් ගෙවීම් සිදු කරන්න. (මෙහි දැක්වෙන බැංකු කාඩ්පත උදාහරණයක් පමණක් බව සලකන්න)




කාඩ්පතෙහි තොරතුරු ඇතුළත් කළ පසු පිටුවෙහි අවසානයට ඇති **Pay Rs.1000.00 Click** කිරීමෙන් විභාග ගාස්තු රු.1000.00ක මුදල අදාල කාඩ්පත මඟින් බැර වී සාර්ථක අයදුම්කරුවකු ලෙස ඔබව ලියා පදිංචි වේ.



***<u>විභාග ගාස්තු ගෙවීමෙන් අනතුරුව පහත දැක්වෙන ආකාරයට පණිවුඩයක් දිස්වනතුරු අදාල පිටුවෙහි රැදී සිටින්න.</u>*** වෙබ් පිටුවෙන් ඉවත් වීම හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීම **(Refresh)** මඟින් ඔබගේ අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ ක්‍රියාවලිය අඩාල විය හැක.




පියවර **08:-**

විභාග ගාස්තු ගෙවීමෙන් අනතුරුව ඔබගේ අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ ක්‍රියාවලිය සාර්ථක බවට සනාථ කරනු ලබන විද්‍යුත් තැපැල් **(E mail)** පණිවුඩයක් ඔබ ලබා දුන් විද්‍යුත් තැපැල් ලිපිනය **(E mail Address)** වෙත ලැබෙන අතර එහි පහත තොරතුරු ඇතුළත් වේ.



[redacted]@gmail.com

Payment Confirmation Inbox

fta@germant... 12:44 pm

to me

From fta@germantec.edu.lk

To [redacted]

Date 11 Jul 2024, 12:44 pm

Standard encryption (TLS).

See security details

Dear [redacted]

Your payment has been successfully updated:

Registration details as follows

**Full Name :** [redacted]
**National Identity Card No :** [redacted]
**Application ID :**0000000272
**Payment Reference No :**0000000272
**Examination Centre (District) :**Colombo
**Examination Medium :**Sinhala
**Registered Email Address :** [redacted]

Best regards,

**The Administration Team**

පියවර **09:-**

පියවර 08හි සඳහන් විද්‍යුත් තැපැල් **(E mail)** පණිවුඩයෙහි මුද්‍රිත පිටපත **(Printout)** සමඟ පහත සහතිකපත්වල ඡායා පිටපත් **2024.08.04** දින හෝ එදිනට පෙර ලැබෙන සේ කළමනාකාර - පරිපාලන හා මානව සම්පත්, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, අංක 582, ගාලු පාර, ගල්කිස්ස. යන ලිපිනයට ලියාපදිංචි තැපැල මඟින් එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අ.පො.ස සාමාන්‍ය පෙළ සහතිකය
(ඇ) ගැසට් නිවේදනයේ හා පුවත්පත් දැන්වීමේ අංක 01හි විශේෂ කුසලතා යටතේ අයදුම් කරන අයදුම්කරුවන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මඟින් නිකුත් කර ඇති පළාත්/ජාතික මට්ටමේ සහතිකය

මුද්‍රිත පිටපත එවීමේදී ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ “පූර්ණ කාලීන ආධුනිකයන් බඳවා ගැනීම - 2024” හා අයදුම් කිරීම සනාථ කරන ලද විද්‍යුත් තැපැල් **(E mail)** පණිවුඩයෙහි සඳහන් **“Application ID”** අංකය සඳහන් කල යුතුය.

**ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු කූට හෝ වංචනික බවට හෙළිවුවහොත් පාඨමාලාවෙන් ඉවත් කරනු ලබන අතර මින් ඉදිරියට ආයතනයේ විභාග සඳහා නුසුදුස්සෙකුද වනු ඇත.**

සැ.යු. - අයදුම් කිරීම පෙ.ව. 01.00 ත් පෙ.ව.2.00 ත් අතර සිදු <u>නොකල</u> යුතුය.

විමසීම් - තාක්ෂණික - 0701640650 රුවිර රණසිංහ මහතා
- අනෙකුත් - 0112605625 / 0112605535

පහත දැක්වෙන **APPLY HERE** හරහා අයදුම්පත්‍රය වෙත පිවිස ඉහත උපදෙස් පිළිපදිමින් ඔබගේ අයදුම්පත පිරවීම ආරම්භ කළ හැක.

APPLY HERE